අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov

**උසස්පෙළ වෘත්තීය විෂය ධාරාව (දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන)**

**12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම 2024-2025**

උසස්පෙළ වෘත්තීය විෂය ධාරාව යටතේ 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවේ. 2024 වසරේ සිට වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කෙරෙන පාසල් අතරින් (අදාළ පාසල් ලේඛන මෙතනින් ලබා ගන්න) තෝරාගත් පාසල්වලට ඇතුළත් වීම සඳහා සිසුන්ට අයදුම්පත් යොමු කළ හැකි අතර මෙම විෂය ධාරාවට සිසුන් ඇතුළත් කර ගැනීමේදී අ.පො.ස. සා/පෙ විභාගයේ සමත් අසමත් භාවය සලකනු නොලැබේ.

වෘත්තීය විෂය ධාරාව යටතේ, 12 ශ්‍රේණියේ පාසල් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර, 13 ශ්‍රේණියේ පහත දක්වා ඇති වෘත්තීය විෂයයන්ගෙන් එකක් යටතේ ඇති NVQ (ජාතික වෘත්තීය සුදුසුකම් ) 04වන මට්ටමේ වෘත්තීය පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට සිසුන්ට හැකියාව ලැබෙනු ඇත.

| | |
|---|---|
| 1. ළමා මනෝවිද්‍යාව හා ආරක්ෂණය | 14. ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 2. සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | 15. ජලජ සම්පත් තාක්ෂණය අධ්‍යයනය |
| 3. ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | 16. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| 4. ප්‍රාසාංගික කලාව | 17. ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය |
| 5. කාර්ය සිද්ධි කළමණාකරනය | 18. මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය |
| 6. ශිල්ප කලා | 19. විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය |
| 7. අභ්‍යන්තර නිර්මාණකරණය | 20. පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය |
| 8. විලාසිතා නිර්මාණකරණය | 21. ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 9. ග්‍රැෆික් නිර්මාණකරණය | 22. ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| 10. සංචරණය හා ආගන්තුක සත්කාර | 23. කලාව හා පිරිසැකසුම්කරණය |
| 11. භූ දර්ශන නිර්මාණකරණය | 24. පාරිසරික අධ්‍යනය |
| 12. ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණය අධ්‍යයනය | 25. පරිගණක දෘඪාංග හා ජාලකරණය |
| 13. පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 26. නිපැයුම්කරණය |

මේ සමඟ ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් ඔබ ඇතුළත්වීමට අපේක්ෂිත පාසලේ විදුහල්පතිට යොමු කරන්න.

වැඩිදුර තොරතුරු සඳහා සතියේ දිනවල පෙ. ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා දුරකථන අංක 0112787136 / 0112786746 අමතිය හැක.

බී.පී. විතානගේ
අධ්‍යාපන අධ්‍යක්ෂ(සැමට අධ්‍යාපන ශාඛාව)

tamilguru.lk